# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1950/4 - 2016 ජනවාරි මස 18 වැනි සඳුදා - 2016.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම

අංක 1883/17 දරන 2014.10.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2 වන වගන්තියට ඉනික්බිතිව පහත සටහන ඇතුළත් වන පරිදි ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය මෙයින් සංශෝධනය කෙරේ.

''සටහන :

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි හෝ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයන්හි ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්/සහකාර වෛද්‍ය නිලධාරීන් ලෙස දැනට සේවයෙහි නියුතු ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් අයදුම්පත් අංක 135/07 හා 136/07හි නියෝග වල සඳහන්ව ඇති තැනැත්තන්ට පමණක්, ශ්‍රේෂ්ඨාධිකරණයේ 2014.07.16 දිනැති නියෝගයෙන් සංශෝධිත 2014.03.07 දිනැති නියෝගයෙහි නියම කරනු ලැබ ඇති නිර්ණායක, ඔවුන් විසින් සම්පූර්ණ කරනු ලබන්නේ නම්, 7.2 වගන්තිය යටතේ දක්වා ඇති බඳවා ගැනීමේ වයස අදාළ නොවිය යුතු ය.''

එකී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ අනෙකුත් විධිවිධාන නොවෙනස්ව බල පැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එච්. එම්. ගාමිණී සෙනවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

02-19

1A - PG 2792— 606 (2016/01)        ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*